

# එක් දෙවි කෙනෙක්ද ත්‍රිත්වයක්ද?

- ජේම්ස් සහ ඩෙබ් ෆ්ලින්ට් -

**[GOD IS ONE OR A TRINITY?]**

# එක් දෙවි කෙනෙක්ද ත්‍රිත්වයක්ද?

- ජේම්ස් සහ ඩෙබ් ඒලිත්ට් -

# පටුන


| | |
|---|---|
| දෙවියන්වහන්සේ ගැන බයිබලය උගන්වන්නේ මොනවාද? | 3 |
| දෙවියන්වහන්සේ එක් තැනැන්වහන්සේය | 5 |
| ස්වාමීන්වහන්සේ (යහ්වෙහ්) එකම සත්‍ය වූ දෙවියන්වහන්සේය | 5 |
| පියාණන්වහන්සේ සත්‍ය වූ එකම දෙවියන්වහන්සේ පමණි | 5 |
| ස්වාමීන්වූ දෙවියන්වහන්සේ (පියාණන්) සර්වබලධාරිය ශ්‍රේෂ්ඨය | 5 |
| යේසුස් වහන්සේ ගැන බයිබලය උගන්වන්නේ කුමක්ද? | 6 |
| දෙවියන්වහන්සේගේ පුත්‍රයා | 7 |
| මනුෂ්‍යයාගේ පුත්‍රයා | 7 |
| යේසුස්වහන්සේ ජීවිතය ආරම්භ කළේ උපතේදීය | 8 |
| යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ සහ මනුෂ්‍යයාගේ පුත්‍රයා වශයෙන් | 8 |
| දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමානද? | 8 |
| ත්‍රිත්වය | 14 |
| ත්‍රිත්ව ධර්මය පැමිණියේ කොතනින්ද? | 15 |
| ත්‍රිත්වයේ ඉතිහාසය | 18 |
| ත්‍රිත්වයේ වඩා මෑත ඉතිහාසය | 20 |
| මෙය සිදුවූයේ කෙසේද? | 21 |
| දෙවියන්වහන්සේ මෙසේ වීමට ඉඩහැරියේ කෙසේද? | 21 |
| මමද මාගේ පියාණන් වහන්සේද එකමය. | 22 |
| පටන්ගැන්මෙහිදී වාක්‍යයාණෝ සිටිසේක. | 24 |
| ලෝගෝස් | 27 |
| සමාප්තිය | 29 |
| ත්‍රිත්වයේ මහා ගැටළු තුන. | 29 |
| ප්‍රශ්න | 32 |

# එක් දෙවි කෙනෙක්ද ත්‍රිත්වයක්ද?

ජේම්ස් සහ ඩෙබී ෆ්ලින්ට්

දෙවියන් වහන්සේගේ පොතවන බයිබලය අප විවෘත කරන විට, දෙවියන්වහන්සේ ඇත්තෙන්ම කවුද, යේසුස් වහන්සේ ඇත්තෙන්ම කවුද කියා නිවැරදිව දැනගැනීමේ වැදගත් භාවය අපි කියවන්නෙමු. එය කොයිතරම් වැදගත්දයත්, අපගේ ගැළවීම ඒ මත පදනම්ව ඇතැයි යේසුස් වහන්සේ පවසයි.

“සදාකාල ජීවනය නම් මේය - එකම සැබෑවූ දෙවියන් වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් හැඳිනගැනීමය” (යොහාන් 17:3)

## දෙවියන්වහන්සේ ගැන බයිබලය උගන්වන්නේ මොනවාද?

පළමුවන පොතේ සිට අන්තිමය දක්වා, දෙවියන්වහන්සේ එක් තැනැත්තෙකු බවත්, උන්වහන්සේට අමතරව වෙනත් දෙවි වරුන් නොමැති බවත් බයිබලය අපට පවසයි.

වසර දහස් ගණනකට ප්‍රථම, ඔවුන් මිසරයේ සිට පිටතට රැගෙන ආවා වූ මෝසෙස් තුළින් දෙවියන්වහන්සේ ඊශ්‍රායෙල්ට කතා කළේය.

“එම්බා ඊශ්‍රායෙලයල්, අසාපන්න අපේ දෙවි වූ ස්වාමීන් වහන්සේ එකම ස්වාමීන්වහන්සේය. නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේට නුඹේ මුළු සිතෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද, නුඹේ මුළු ශක්තියෙන්ද ප්‍රේම කරපන්න.” (ද්විතිය කථාව 6:4-5)

පසුව ඊශ්‍රායලයේ දාවිත් රජු ලිවේ :

“ස්වාමීන් වහන්ස, අපේ කන්වලින් අප ඇසූ සියල්ල ලෙස ඔබට සමාන කෙනෙක් නැත. ඔබ වහන්සේ හැර වෙන කිසි දෙවිකෙනෙක්ද නැත.” (1 ලේකම් 17:20)

යෙසායා තුළින් දෙවියන්වහන්සේ මෙසේ පවසයි.

මම ඒ තැනන්වහන්සේ බව නුඹලා දැනගෙන මා විශ්වාස කර තේරුම් ගන්න පිණිස, නුඹලා මාගේ සාක්ෂිකාරයෝව, මා විසින්

තෝරාගත් මාගේ මෙහෙකරුවාට සිටින්නාහුයැයි ස්වාමින්වහන්සේ කියන සේක. මා සිටින්නට පළමුවෙන් කිසි දෙවිකෙනෙක් සාදනු ලැබුවේ නැත. <u>මට පසුව සිටින්නේත් නැත.</u>" (යෙසායා 43:10)

"මක්නිසාද, ස්වර්ගය මැවුවාවූ, පොළව මවා සාදා එය පිහිටෙවුවාවූ, එය හිස් බවට නොයවා වාසය පිණිස එය සෑදුවාවූ දෙවියන්වහන්සේ වන ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. මම ස්වාමින්වහන්සේය. <u>වෙන කෙනෙක් නැත.</u>" (යෙසායා 45:18)

අප අලුත් ගිවිසුමට එන විට, එම පණිවුඩයම නැවත කියමින් දෙවියන්වහන්සේ එකම තැනන්වහන්සේ බව පවසයි. අපෝස්තුලුවර පාවුල් පවසන්නේ ,

"අපට ඇත්තේ <u>එක දෙවිකෙනෙක්</u> වන පියාණන්වහන්සේය. සියල්ල පැමිණ තිබෙන්නේ උන්වහන්සේගෙන්ය. අපිත් උන්වහන්සේ උදෙසාය. තවද අපට ඇත්තේ එක ස්වාමින් වහන්සේය. එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. සියල්ල උන්වහන්සේ කරණකොටගෙනය. අපිත් උන්වහන්සේ කරණකොටගෙනය." (1 කොරින්ති 8:6)

"එක ආත්මයානන් වහන්සේත්, එක ස්වාමින්වහන්සේත්, එක ඇදහිල්ලත්, එක බෞතිස්මයත්, සියල්ලත් කෙරෙහිද සියල්ලන් කරනකොට ගෙනද සියල්ලන් තුළද පවතින්නාවූ, <u>සියල්ලන්ට එකම පියවූ දෙවියන්වහන්සේය.</u>" (එපීස 4:5-6)

"මක්නිසාද ඇත්තේ <u>එක දෙවිකෙනෙක්</u> සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යන්ටත් අතර එක මැදිහත්කාර කෙනෙකුත්ය." (1 තිමෝති 2:5)

දෙවියන් වහන්සේ එකම සත්‍යයවූ දෙවියන් බවත්, උන්වහන්සේට අමතරව වෙනත් දෙවිවරුන් නොමැති බවත් බොහෝ පද බයිබලය පුරාම අපට පවසයි.

වඩාත් සම්පූර්ණ වූ සංසන්දනාත්මක ලැයිස්තුවක් සඳහා ඊළඟ පිටෙහි ඇති පද සලකා බලන්න.

**දෙවියන්වහන්සේ එක් තැනැන්වහන්සේය :**

යෝබ් 31:15 , සෙකරියා 14:9 , මලාකි 2:10 , මතෙව් 19:17 , 23:9 , මාර්ක් 2:7, 10:18, 12:29, 32 , ලූක් 18:19, යොහාන් 8:41 , රෝම 3:30 , 1කොරින්ති 8:4,6 , ගලාති 3.20 , එපීස 4:6 , 1 තිමෝති 2:5 , ජේම්ස් 2:19, 4:12

**ස්වාමීන්වහන්සේ (යහ්වෙහ්) එකම සත්‍ය වූ දෙවියන්වහන්සේය.**

නික්මයාම 8:10, 9:14 , ද්විතිය කථාව 4:35-39, 7:9, 32:12-40 , 1සාමුවෙල් 2:2 , 2 සාමුවෙල් 7:22 , 22:32 , 1 රාජාවලියි 8:23 , 39 , 60, 18:17-39; 2 රාජාවලිය 5:15 , 19:15-19 , 1 ලේකම් 16:25, 26, 2 ලේකම් 6:14 , 13:9 නෙහෙමියා 9:6 , යෝබ් 9:8 , ගීතාවලිය 18:31, 62:2, 5-6, 71:16, 19 , 72:18 , 73:25 , 83:18, 86:8-10 , 89:6-11 , 90:1-2 , 96:4-5 , 118:27 136:4 , 148:13 , යෙසායා 37:16-20 , 40:18-25 , 41:4 43:10-13 , 44: 6-8 , 24 , 45:5-7 , 14 , 18 , 21-22 , 46:9 යෙරමියා 3:11 , 5:7, 10:6-16 , 16:20 , හොසියා 13:4 , යෝවෙල් 2:27 , මාර්ක් 12:32 , යොහන් 13:16 , 14:28 , 17:3 , ක්‍රියා 19:26 , රෝම 16:27 , 1 කොරින්ති 8:4-6 10:20 , ගලාති 4:8 , 1 තිමෝති 1:17 , 2:5 , 6:15-16 , 1 යොහන් 5:20 , යුද් 25 , එළිදරව් 15:4

**පියාණන්වහන්සේ සත්‍ය වූ එකම දෙවියන්වහන්සේ පමණි.**

ද්විතිය කථාව 32:6 , 2 සාමුවෙල් 7:8-14 , 1 ලේකම් 17:11-14 , 29:10 ගීතාවලිය 2:7 , 89:26-29 , යෙසායා 42:1 , 61:1-2 , 63:16 , 64:8 , යෙරමියා 3:4 , 19 , 31:9 , මලාකි 1:6 , 2:10 , මතෙව් 11:25 , 24:36 මාර්ක් 10:18 , 13:32 , ලූක් 10:21 , 18:19 , යොහාන් 1:18 , 5:43-44 6:27 , 45 , 8:41-42 , 54 , 14:28 , 17:1-3 , 20:17 , ක්‍රියා 7:55-56 රෝම 1:7 , 15:6, 1 කොරින්ති 1:3 , 8:6, 11:3 , 15:24 , 2 කොරින්ති 1:2-3 , 11:31 , ගලාති 1:1-5 , එපීස 1:2-3 , 17 , 4:5-6 , 5:20 , 6:23 පිලිප්පි 1:2, 2:11, 4:20 , කොලොස්සි 1:2-3 , 3:17 , 1 තෙසලෝනික 1:1-3 , 3:11 , 13 , 2 තෙසලෝනි 1:1-2 , 2:16 , 1 තිමෝති 1:2 , 2 තිමෝති 1:2 , ටයිටස් 1:4 , පිලෙමොන් 3 , හෙබ්‍රෙව් 12:7 , ජේම්ස් 1:27 , 3:9, 1 පේතෲස් 1:2-3 , 2 පේතෲස් 1:17 , 2 යොහාන් 3 , 9 , යුද්: 1, එළිදරව් 1:6.

**ස්වාමින්වූ දෙවියන්වහන්සේ (පියාණන්) සර්වබලධාරිය, ශ්‍රේෂ්ඨය.**

උත්පත්ති 18:25 , නික්මයාම 20:3-5 , 22:20 , ද්විතිය කථාව 10:17 යෝෂුවා 3:11 , 13 , 22:22 , 1 සාමුවෙල් 7:3-4 , 1 රාජාවලිය 18:17-39 1

ලේකම් 29:11 , ගීතාවලිය 47:2 , 7 , 83:18 , 97:9 , 110:1 , 136:1-26 , යෙසායා 2:11 , 17 , 26:13-14 , 44:24 , දානියෙල් 2:47 , 3:29 , 11:36 , සෙකරියා 6:5 , මතෙව් 4:10 , 24:36 , මාර්ක් 5:7 , ලූක් 4:8 , 8:28 , යොහාන් 5:44 , ක්‍රියා 7:48 , 16:17 , රෝම 16:27 , 1 කොරින්ති 3:23, 11:3 , 15:24-28 , 2 කොරින්ති 6:18 , එපීස 3:14 , 4:6 , 1 තිමෝති 1:17 , 6:14-16 හෙබ්‍රෙව් 7:1 , යූද් 25 , එළිදරව් 1:8 , 4:8 , 11:17 , 15:3-4 , 16:7 , 14, 19:6 , 15 , 21:22.

## යේසුස් වහන්සේ ගැන බයිබලය උගන්වන්නේ කුමක්ද?

ලෝකයෙහි පාපය දුරුකරලන්නට කන්‍යාමරියා තුළින් උපන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයා බැව් බයිබලය එළිදරව් කරයි.

යේසුස් නමැති දරුවෙක් ශුද්ධාත්මයේ බලයෙන් මරියාගේ කුසෙහි පිළිසිඳවන්ට දෙවියන්වහන්සේට හැකිවිය.

> "බලව නුඹ ගර්භණීව පුත්‍රයෙකු වදන්නිය. උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. උන්වහන්සේ උතුම්ව මහෝත්තමයාණනගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිවූ ස්වාමින්වහන්සේ උන්වහන්සේට දෙන සේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලෙටම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යයේ කෙලවර නොවන්නේයයි කියේය. එවිට මරියා දේව දූතයාට කතා කොට : මා පුරුෂයකු නැඳින සිටින බැවින්, මේක වෙන්නේ කෙසේදැයි කීවාය. දේවදූතයා ඇට උත්තර දෙමින් : ශුද්ධාත්මයාණන් නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ අනුභාවයද නුඹ වසා ගන්නේය. ඒ නිසා උපදින්න සිටින තැනැත්තේ ශුද්ධය දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක." (ලූක් 1:31-35)

> "නමුත් කාලය සම්පූර්ණ වූ කල, දෙවියන්වහන්සේ ස්ත්‍රියකුගෙන් උපන්නාවූද, ව්‍යවස්ථාව යටතේ උපන්නාවූද, තමන් පුත්‍රයාණන් වහන්සේ එවූ සේක. (ගලාති 4:4)

එම නිසා දෙවියන්වහන්සේ ඔහුගේ පියාණන් සහ මරියා ඔහුගේ මව වන්නේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා සහ මනුෂ්‍යයාගේ පුත්‍රයා (ස්ත්‍රියගෙන්) වූ නිසාය.

## දෙවියන්වහන්සේගේ පුත්‍රයා

යේසුස් වහන්සේ වචනයේ පරිසමාප්තියෙන්ම දෙවියන්ගේ පුත්‍රයාවූ නිසා , ඔහුට දෙවියන් සමඟ නියම පිය-පුත් සම්බන්ධතාවයක් විය.

> "උන්වහන්සේ මාංශමත්ව සිටි දවස් වලදී තමන්වහන්සේ මරණයෙන් ගලවන්නට පුළුවන් වූ තැනන්වහන්සේට බලවත් හැඬීමෙන් සහ කඳුලින් යුක්ත යාච්ඤා සහ කන්නලව් ඔප්පුකර, තමන්ගේ දේවභය නිසා උත්තර ලැබ. උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙනගත් සේක." (හෙබ්‍රෙව් 5:7-8)

ඔහු බොහෝ විට ඔහුගේ පියාණන් ආමන්ත්‍රණය කල අතර උන්වහන්සේගෙන් උගත්තේය.

> "තවද ඒ දවස්වලදී උන්වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට ගොස් දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් මුළු රාත්‍රිය කළ සේක. (ලූක් 6:12)

## මනුෂ්‍යයාගේ පුත්‍රයා

මනුෂ්‍යය පුත්‍රයෙකු වශයෙන් පාපයට පෙළඹවීම සහ මරණීය ස්වභාවය යේසුස් වහන්සේට උරුම විය.

> "එහෙයින් දරුවන් ලේ හා මාංශයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේත් එම ආකාරයෙන් ඒවාට පංගුකාරයෙක් වූ සේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යසෂාව මරණය කරණකොට ගෙන බල නැති කොට" (හෙබ්‍රෙව් 2:14)

> "මක්නිසාද දෙවියන්වහන්සේ තමන්වහන්සේගේම පුත්‍රයානන් පාප-මාංශයේ සාමානකමෙන්ද, පාපය නිසාද ඒවා, මාංශයේ පාපය දඬුවමට පත්කරමින් , මාංශය කරණකොටගෙන දුර්වලවූ ව්‍යවස්ථාවට බැරිවූ දේ ඉෂ්ඨකළ සේක." (රෝම 8:3)

වඩා පූර්ණ වූ කියැවීම් සඳහා පහත දැක්වෙන පද සලකා බලන්න.

**යේසුස්වහන්සේ ජීවිතය ආරම්භ කලේ උපතේදීය.**

උත්පත්ති 3:15 , 13:15 , 17:8 , 22:18 , ද්විතිය කථාව 9:6,7, 18:15-19, 2 සමුවෙල් 7:11-14 , 1 ලේකම් 17:11-14 , ගීතාවලිය 89:27 : 139:15-16 , යෙසායා 7:14 , 49:1-5 , යෙරමියා 1:5 , 30:21, මීකා 5:2-5, මතෙව් 1:20-24, 2:1-6, 13:35, 25:34, ලූක් 1:30-35 (1:13-17 බලන්න) 2:40, 52 (1:80 බලන්න), 11:50, යොහාන් 7:42, 8:56, 12:41, 17:5,24, ක්‍රියා 2:22-24, 15:18, රෝම 4:17, 8:28-30, 9:23, 11:2, 1 කොරින්ති 2:7, ගලාති 1:15, 3:16, 4:4, එපීස 1:3-5, 2 තෙසලෝනික 2:13, 2 තිමෝති 1:9-10, ටයිටස් 1:2-3, 1 පේතෘස් 1:1-2, 11, 19-21, එළිදරව් 13:8, 17:8

**යේසුස්වහන්සේ දෙවියන්වහන්සෙගේ සහ මනුෂයයාගේ පුත්‍රයා වශයෙන්**

ගණන් කථාව 23:19, 1 සාමුවෙල් 15:29, යොබ් 9:32-33, 33:12, ද්විතිය කථාව 18:15-19, ගීතාවලිය 80:17, සෙකරියා 6:12, 13:7, මතෙව් 24:30-44, මාර්ක් 13:26, ලූක් 21:27,36, යොහාන් 3:2, 8:40, 19:5, ක්‍රියා 2:22, 7:56, 13:38, 17:31, රෝම 5:15, 1 කොරින්ති 15:21, 47, එපීස 2:15. 4:13, 1 තිමෝති 2:5, එළිදරව් 1:13, 4:14, යෙසායා 47:3, 55:8-9, යෙරමියා 30:12, සෙකරියා 6:12, 13:7, මලාකි 3:6

**දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමානද?**

ඇත්තේ එක දෙවිකෙනෙකු බවත් යේසුස්ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා බවත් බයිබලය උගන්වන බැව් අපි දුටුවෙමු. යේසුස් වහන්සේ සහ දෙවියන් වහන්සේ එකම පදාර්ථයකින් සෑදී හෝ දෙදෙනා සහ - සමාන සහ සහ-සදාකාලික වීම විය හැකිද?

අප සඳහා දෙවියන්වහන්සේගේ වචනයේ වාර්ථා කර ඇති, යේසුස්වහන්සේ හා දෙවියන්වහන්සේ අතර වෙනස්කම් කිහිපයක් පහත දැක්වෙන වගුවල දක්වා ඇත.

| | |
|---|---|
| **දෙවියන්වහන්සේ පරීක්ෂාවට ලක්කරණු බැරිය.**<br><br>"යමෙක් පරීක්ෂාකරනු ලබන කළ: මම දෙවියන්වහන්සේගෙන් පරීක්ෂා කරනු ලබමි යි නොකියාවා මක්නිසාද, දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්ෂා කරනු ලබන්ට නුපුලුවන. උන්වහන්සේම කිසිවෙකු පරීක්ෂා නොකරන සේක. (ජේම්ස් 1:13) | **යේසුස්වහන්සේ පරීක්ෂාවට ලක්විය.**<br><br>"මක්නිසාද, උන්වහන්සේම පරීක්ෂා කරනු ලැබ දුක්වින්ද, බැවින්, පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිට වෙන්ටත් උන්වහන්සේට පුළුවන" (හේබ්‍රෙව්2:18)<br><br>"මක්නිසාද, අපට සිටින්නේ අපේ දුර්වලකම් වලදී, අපේ දුක් නොදැනෙන උත්තම පූජකයෙක් නොව පව්කිරීමක් නැතිව, සියලු ආකාරයෙන්ම අපවාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්ය. (හේබ්‍රෙව් 14:15) |
| **දෙවියන්වහන්සේ දැකීමට නොහැක.**<br><br>"කිසිවෙකුට ලඟාවෙන්ට බැරි ආලෝකයෙහි වසන්නාවූ. කිසි මනුෂයෙකු විසින් නුදුටුවාවූ, දකින්ටත් බැරිවූ." (1 තිමෝති 6:16) | **යේසුස් දෘශ්‍යමාණ විය.**<br><br>"මේ වනාහි යේසුස්වහන්සේ මළවු-න්ගෙන් නැගිටි පසු ගෝලයන්ට ප්‍රකාශවූ තුන්වෙනි වතාවය" (යොහාන් 21:14) |
| **දෙවියන්වහන්සේ සියල්ල දන්නා සේක.**<br><br>"මට නොපෙනෙන ලෙස යමෙකුට රහස් තැන්වල සැඟවෙන්ට පුළුවන්දැයි ස්වාමින්වහන්සේ කියන සේක. ස්වර්ගය හා පෘතුවිය මාගෙන් පිරී තිබෙනවා නොවේද?" (යෙරමියා 23:24) | **යේසුස්වහන්සේ ඉගෙනගත් සේක.**<br><br>"යේසුස්වහන්සේ ප්‍රඥාවෙන් සහ උසමහතින්ද, දෙවියන්වහන්සේගෙත් මනුෂ්‍යයාගේත් කරුණාවෙහි වැඩුණු සේක. (ලූක් 2:52)<br><br>"උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත් තමන් වින්ද, දේවලින් කීකරුකම ඉගෙනගත් සේක. (හේබ්‍රෙව් 5:8) "නමුත් ඒ දවසේවත් ඒ පැයවත් |

| | |
|---|---|
| | පියාණන් වහන්සේ මිස අන්කිසිවෙක් දන්නේ නැත. ස්වර්ගයෙහි සිටින දූතයෝවත් පුත්‍රයාවත් නොදනිති. (මාර්ක් 13:32) |
| **දෙවියන්වහන්සේ මිය යාමට නුපුළුවන** | **යේසුස්වහන්සේ මියගියේය.** |
| "ඉතින් මා පමණක්ම උන්වහන්සේ බවත් මා මිස අන් දෙවිකෙනෙක් නැති බවත් බලාපල්ලා....මා සදාකාලෙටම ජීවත්වන්නාක් මෙන් (ද්විතිය කථාව 32:39-40) | "ඉතින් මාත් ලබාගන්නා දේ සියල්ලටම පළමුවෙන් නුඹලාට භාර දුනිමි. එනම්, ලියවිල්ල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස් වහන්සේ මැරුණ බවත්" (1 කොරින්ති 15:3) |
| "එකම අමරණීයවූ" (1 තිමෝති 6:15) | "මම මැරුණෙමි, නමුත් බලව මම දැන් සදාකාලෙටම ජීවත්ව සිටිමි" (එළිදරව් 1:18) |
| **දෙවියන්වහන්සේ කිසිවකුට යටත් නොවේ.** | **යේසුස්වහන්සේ දෙවියන් වහන්සේට යටත්ය.** |
| "මම ස්වාමින්වහන්සේය: මාගේ නාමය ඒකය. මාගේ ගෞරවය අන්කෙනෙකුට නොදෙන්නෙමි." (යෙසායා 42:8) | "පියාණන්වහන්සේ මට වඩා උතුම්ය." (යොහන් 14:28) "නමුත් එක එක පුරුෂයාගේ හිස ක්‍රිස්තුස් වහන්සේගේ බවද, ස්ත්‍රියගේ හිස පුරුෂයා බවද, ක්‍රිස්තුස්වහන්සේගේ හිස පියාණන්වහන්සේ බවද නුඹලා දැනගන්නවාට කැමැත්තෙමි." (1 කොරින්ති 11:3)<br><br>"පුත්‍රයාණන් වහන්සේත් තමන්ට සියල්ල යටත් කළ තැනන් වහන්සේට යටත් වන සේක." (1 කොරින්ති 15:28) |

| | |
|---|---|
| **දෙවියන් වහන්සේ සදාකාල වනසේක.**<br><br>"ඉදින් අමරණීයවූ, අදෘශ්‍යමානවූ, එකම දෙවිවූ සදාකාල රජ්ජුරුවන් වහන්සේට ගෞරවයද, තේජසද සදාකාලෙටම වේවා" (1 තිමෝති 1:17) | **යේසුස්වහන්සේ මවන ලදී.**<br><br>"කාලය සම්පූර්ණ වූ කළ, දෙවියන් වහන්සේ ස්ත්‍රියකුගෙන් උපන්නාවූද, ව්‍යවස්ථාව යටතේ උපන්නාවූද , තමන් පුත්‍රයාණන් වහන්සේ එවූ සේක." (ගලාති 4:4)<br><br>"නුඹ මාගේ පුත්‍රයාය. මම අද නුඹ ජනිත කළෙමි." (හෙබ්‍රෙව් 1:5) |
| **දෙවියන්වහන්සේ සියලු බලයෙන් යුක්තය.**<br><br>"බලව මම මාංගමවූ සියල්ලන්ගේ දෙවියන්වහන්සේ වන ස්වාමීන් වහන්සේය. මට කරන්ට අමාරුවූ කිසි දෙයක් ඇත්ද? (යෙරමියා 32:27)<br><br>"ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන් වහන්සේද, ඔහුගේ මැවුම්කාරයාද වූ ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක. මතු පැමිණෙන දේ ගැන මගෙන් අසාපල්ලා , මාගේ පුත්‍රයන් ගැනද මාගේ අළුත් ක්‍රියාවල් ගැනද මට අණකරපල්ලා. පොළව සාදා ඊ පිට මනුෂ්‍යයා මැවුවේ මමය. මා විසින් එසේය, මාගේ අත් වලින් අහස විදහනලද්දේය. මම එහි මුළු සේනාවට නියම කළෙමි." (යෙසායා 45:11-12) | **යේසුස්වහන්සේ සියලු බලයෙන් යුක්ත නොවේ.**<br><br>"එබැවින් යේසුස්වහන්සේ උත්තර දෙමින් : සැබැවක් සැබැවක් නුඹලාට කියමි. පියාණන්වහන්සේ යමක් කරනවා පුත්‍රයා දකින්නේද, ඒ දේ මිස තනියම කිසිවක් කරන්ට ඔහුට බැරිය. මක්නිසාද උන්වහන්සේ යමක් කරනසේක්ද, පුත්‍රයාත් ඒ දේ එසේම කරන්නේය. කුමක් හෙයින්ද, පියාණන්වහන්සේ පුත්‍රයාට ප්‍රේමකරන සේක. තමන් වහන්සේ කරන්නාවූ සියල්ල ඔහුට පෙන්වන සේක." (යොහන් 5:19-20)<br><br>"උන්වහන්සේ මාංසවත්ව සිටි දවස්වලදී තමන් තමන්වහන්සේ මරණයෙන් ගළවන්ට පුළුවන්වූ තැනන්වහන්සේට බලවත් හැඬීමෙන් හා කඳුළින් යුක්ත යාච්ඤා සහ කන්නලව් ඔප්පුකර, තමන්ගේ දේවභය නිසා උත්තර ලැබ." (හෙබ්‍රෙව් 5:7-8) |

| | |
|---|---|
| **දෙවියන්වහන්සේ සම්පූර්ණය** | **යේසුස්වහන්සේ සම්පූර්ණ කිරීමට උවමනා විය.** |
| "එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක් මෙන් නුඹලාත් සම්පූර්ණව සිටපල්ලා. (මතෙව් 5:48) | "මෙසේ උන්වහන්සේ සම්පූර්ණ කරනු ලැබ, ........... සදාකාල ගැළවීමේ කර්තෘවූ සේක." (හෙබ්‍රෙව් 5:9-10)<br><br>"මට යහපත්යයි නුඹ කියන්නේ මක්නිදාසද? එක්කෙනෙක්, එනම්, දෙවියන්වහන්සේ මිස වෙන කිසිවෙක් යහපත් නොවේ." (ලූක් 18:19) |
| **දෙවියන්වහන්සේ වෙනස් වන්නේ නැත.** | **යේසුස්වහන්සේ වෙනස් විය.** |
| "මක්නිසාද ස්වාමීන්වහන්සේ වන මම වෙනස් නොවෙමි, එබැවින් යාකොබ්ගේ පුත්‍රයෝ වූ නුඹලා විනාශ නොවී සිටින්නාහුය. (මලාකි 3:6) | "ඔබ දේවදූතයාට වඩා ඔහු මඳක් පහත් කළ සේක. ඔබ තේජසද ගෞරවයද නමැති ඔටුන්න ඔහුට පැළඳවූ සේක. ඔබගේ හස්තකර්ම කෙරෙහි ඔහු ආණ්ඩුකාරයා කළ සේක." (හේබ්‍රෙව් 2:7) |
| **දෙවියන්වහනසේට දෙවි කෙනෙක් නොමැත.** | **යේසුස්වහන්සේට දෙවි කෙනෙක් සිටී.** |
| "ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක : මම පළමු වෙනියාය, අන්තිමයාත් මමය. මා හැර වෙන දෙවිකෙනෙක් නැත. .................. මා හැර වෙන දෙවිකෙනෙක් ඇද්ද? නැත." (යෙසායා 44:6-8) | "මට අත නොගසන්න : මක්නිසාද මම තවම පියාණන්වහන්සේ වෙතට නොනැගෙමි. නමුත් මාගේ සහෝදරයන් ළඟට ගොස් මම මාගේ පියාණන් වහන්සේ හා නුඹලාගේ පියාණන්වහන්සේද මාගේ දෙවියන්වහන්සේ හා නුඹලාගේ දෙවියන්වහන්සේද වෙතට නගිමියි ඔවුන්ට කියාපන්න." (යොහන් 20:17) |

**දෙවියන්වහනසේට දෙවි කෙනෙක් නොමැත.**

"ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක : මම පළමු වෙනියාය, අන්තිමයාත් මමය. මා හැර වෙන දෙවිකෙනෙක් නැත. ................ මා හැර වෙන දෙවිකෙනෙක් ඇද්ද? නැත." (යෙසායා 44:6-8)

**යේසුස්වහන්සේට දෙවි කෙනෙක් සිටී.**

"මට අත නොගසන්න : මක්නිසාද, මම තවම පියාණන්වහන්සේ වෙතට නොනැගෙමි. නමුත් මාගේ සහෝදරයන් ළඟට ගොස් - මම මාගේ පියාණන් වහන්සේ හා නුඹලාගේ පියාණන්වහන්සේද, මාගේ දෙවියන්වහන්සේ හා නුඹලාගේ දෙවියන්වහන්සේද, වෙතට නගිමියි ඔවුන්ට කියාපන්න." (යොහන් 20:17)

**දෙවියන්වහන්සේ මිනිසෙකු නොවේ.**

"බොරු කියන්ට දෙවියන්වහන්සේ මනුෂ්‍යයෙක්වත් තැවෙන්ට මනුෂ්‍ය පුත්‍රයෙක්වත් නොවන සේක. උන්වහන්සේ කී දේ නොකරන සේක්ද? උන්වහන්සේ කථා කළ දේ ඉෂ්ට නොකරන සේක්ද? (ගණන් කථාව 23:19)

**යේසුස්වහන්සේ මනුෂ්‍යයෙකි.**

"නුඹලාම දන්නා ලෙස නුඹලා අතරේ දෙවියන් වහන්සේ විසින් නාසරත්හි යේසුස් වහන්සේ ලවා කරවන ලද, බලවත් ක්‍රියාවලින්ද, පුදුම වලින්ද, ලකුණු වලින්ද, දෙවියන් වහන්සේ විසින් ඒත්තුගනු ලැබ මනුෂ්‍යයෙක්වූ එම යේසුස් වහන්සේ," (ක්‍රියා 2:22)

"මක්නිසාද, ඇත්තේ එක දෙවිනෙක් සහ දෙවියන් වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදිහත්කාර කෙනෙකුත්ය....... මනුෂ්‍යයාවූ ක්‍රිස්තුස් යේසුස් වහන්සේය" (1 තිමෝති 2:5-6)

**දෙවියන්වහන්සේ නිදානොගනියි.**

ගීතාවලිය 121:2-4

**යේසුස්වහන්සේ නිදා ගත්සේක.**

මාර්ක් 4:37-38 , මාර්ක් 8:24

මේ වෙනස්කම් දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ අසමසම වෙනස් පුද්ගලයන් දෙදෙනෙකු බැව් පැහැදිලි කරයි.

## ත්‍රිත්වය

මෙම පොතේ මෙතෙක් දුරට කියන ලද සියල්ලට බයිබලයේ උද්ධෘත පමණක්ම ආධාරක ලෙස යොදා ඇත. කෙසේ නමුත් ත්‍රිත්වය සාකච්චා කිරීමේදී එය එසේ නොහැකි වනුයේ ත්‍රිත්වයේ ආරම්භය බයිබලයට බාහිරව ඇති හෙයිනි.

බයිබලයේ කිසිම තැනක "ත්‍රිත්වය" නමැති වචනය සොයාගත නොහැකි අතර, ත්‍රිත්වයේ වදන් වන "පුත්‍රයාවන දෙවියන්වහන්සේ" හෝ "ශුද්ධාත්මයානන් වන දෙවියන්වහන්සේ" සොයාගත නොහැක.

ත්‍රිත්වයේ ධර්මය පිළිගන්නා ආගමික ඉතිහාසඥයෝ සහ අර්ථකථකයන් මෙම ධර්මය පරණ ගිවිසුමේ උගැන්වීමක් නොවන බැව් පිළිගනිති. "අද අටුවාචාරීන් සහ මතධාරීන්, ත්‍රිත්වයේ ධර්මය හෙබ්‍රෙව් බයිබලයේ අඩංගු වී නොමැති බවට එකඟ වේ."

(මර්සියා, ඊ, සංස්කාරක, ආගමික විශ්වකෝෂය, ත්‍රිත්වය, නිව්යෝර්ක් 1987:15:54)

අපි අලුත් ගිවිසුමේ ත්‍රිත්වය ගැන කියවන්නෙමුද? එම ප්‍රකාශනයේම අපි මෙසේ කියවමු :

"නිශ්චිත ත්‍රිත්ව ධර්මය පිළිබඳ සඳහනක් අලුත් ගිවිසුමේද අඩංගු නොවීම ගැන අටුවාචාරීන් සහ මතධාරීන් එකඟවේ." (මර්සියා, ඊ, සංස්කාරක, ආගමික විශ්වකෝෂය, ත්‍රිත්වය, නිව්යෝර්ක්: 1987:15:54)

බයිබලය සම්පූර්ණ කළාට පසුව, ත්‍රිත්ව ධර්මයේ ක්‍රමික වර්ධනය බොහෝ අය දන්නා අතර එම ධර්මය පිළිගන්නා අය විසින්ද එය නැතැයි කියනු නොලැබේ. නව කතෝලික විශ්වකෝෂයේ ඇති සඳහන සලකා බලන්න.

"4 වන සියවසේ අවසානයට ප්‍රථම, එක දෙවිකෙනෙකු තුළ තැනන් වහන්සේලා තුන්දෙනෙක් නමැති සූත්‍රය ශක්තිමත්ව තහවුරු වී නොතිබුනි. නමුත් ත්‍රිත්ව දෘශ්ඨය කෙරෙහි පළමුවෙන් අයිතිය ප්‍රකාශ කරන්නේ නියමිතව මේ සූත්‍රයයි. අපෝස්තලික පියවරුන් අතර, මෙම මානසිකත්වයට හෝ දෘෂ්ඨියට ලඟාවෙන කිසිවක් තිබී නැත." (නව කතෝලික

විශ්වකෝෂය, නිව්යෝර්ක්, ගිල්ඩ් ප්‍රකාශකයෝ: 1967 - 1974 ත්‍රිත්වය: 14:299)

දෙවියන්වහන්සේගේ වචනය තුළ සම්භ නොවන ත්‍රිත්ව ධර්මය, මෙතරම් ජනප්‍රිය සහා උගැන්වීමක් වූයේ කෙසේද? ත්‍රිත්ව ධර්මය හැඩගසන්නාවූ අදහස් අපෝස්තලික පියවරුන්ගෙන් නොපැමිණියේ නම්, මේ අදහස් පැමිණියේ කොතනින්ද?

## ත්‍රිත්ව ධර්මය පැමිණියේ කොතනින්ද?

පුරාණ යුගයේ සිට ක්‍රිස්තියානි - නොවන ආගම් තුළ ත්‍රිත්ව දෙවිවරු උගන්වා ඇත. මෙසපොතේමියාවේ එවැනි ත්‍රිත්වයක් වූයේ අනු (ආකාශයේ දෙවියන්), එන්ලිල් (පෘතුවියේ දෙවියන්) සහ එආ (ජලයේ දෙවියන්), පුරාණ බැබිලෝනියාවේ තවත් ත්‍රිත්වයක් නිම්රෝද්, සෙමිරාමස් සහ ටම්මුස් යන දෙවිවරුන්ගෙන් යුතු විය. ක්‍රිස්තෝත්පත්තියට පෙර හා පසු සියවස්වල මිසරයේ, ග්‍රීසියේ සහ රෝමයේ දෙවිවරුන් තිදෙනාගේ කණ්ඩායම් කිරීම සාමාන්‍ය දෙයක් විය.

අපෝස්තලුවරුන්ගේ මරණයට පසු, එවන් අදහස් ක්‍රිස්තියානිය තුළට පැමිණීමට පටන්ගත් අතර, "ඊජිප්තු ආගම" නමැති පොතේ සික්ෆ්‍රිඩ් මොරෙන්ස් මෙසේ සටහන් කරයි.

"ත්‍රිත්වය ඊජිප්තු ධර්ම වල උතුම් මල්කඩක් විය. දෙවිවරුන් තිදෙනෙක් සංයුක්ත කොට එක් අයෙක් සේ සලකා ඒක වචනයෙන් ආමන්ත්‍රණය කළේය. මේ අනුසාරයෙන්, ක්‍රිස්තියානි ධර්මය සමඟ ඍජු පුරුකක් ඊජිප්තු ආගමේ අධ්‍යාත්මික බලය පෙන්වයි.

(මොරෙන්ස්, එස්, ඊජිප්තු ආගම, කෝනෙල් සරසවි මුද්‍රණාලය 1973 : 254 - 257)

සභාවේ නායකයන් විසින් ත්‍රිත්ව විෂයය සාකච්චා කළේ ඊජිප්තුවේ බැවුද වැදගත් කාරණයකි. මක්නිසාද, එඩ්වඩ් ගිබන්ස්ගේ "ක්‍රිස්තියානියේ ඉතිහාසය" ඔවුන්ගේ සාකච්චා වලට ඊජිප්තු ආගම බලපෑ සැටි අපට කියවයි:

"ක්‍රිස්තියානිය විසින් මිත්‍යාදහම් යටත්කර ගත්තා නම්, මිත්‍යා දහම් විසින් ක්‍රිස්තියානිය දූෂණය කළ බැව්ද ඒ හා සාමනම සත්‍යයකි. පළමුවැනි සියවසේ ක්‍රිස්තියානින්ගේ පිරිසිදු දේවවාදය.......... රෝමයේ පල්ලිය විසින් වටහාගන්නට නොහැකි වූ ත්‍රිත්ව වාදයකට පෙරලන ලදී.

ඊජිප්තුරුවන් විසින් නිපදවන ලද සහ ප්ලේටෝ විසින් පරමාදර්ශය කරන ලද මිත්‍යා විශ්වාසවල බොහෝ ප්‍රතිපත්ති, ඇදහිලිවලට යෝග්‍ය යැයි සලකා තබා ගන්නා ලදී." (ඊ, ගිබන් "ක්‍රිස්තියානියේ ඉතිහාසය" නැවත ප්‍රකාශය ආර්නෝ මුද්‍රණාලය මගින් : 1972)

ආගමික ශබ්දකෝෂයක, ක්‍රිස්තියානිය මත ක්‍රිස්තියානි නොවන දර්ශන හෙලූ බලවත් බලපෑම් නැවතත් පිළගනී.

"ත්‍රිත්වය, මිත්‍යා ආගම් තුළින් ගත් දූෂණයක් වන අතර එය ක්‍රිස්තියානි විශ්වාසය මත බද්ධ කරන ලදී." (ආගමික දැනීම ගැන ශබ්දකෝෂයක්, ලයිමන් ඇබොට්, 1875 "ත්‍රිත්වය" කොටස 944 පිට)

මෙම සමහර පුරාතණ ත්‍රිත්ව අදත් වන්දනා කරනු ලබත්. මිසරයේ ත්‍රිත්වයක් (ඔසිරිස්, අයිසිස් සහ හෝරස් නමැති දෙවියන් තිදෙනාගෙන් සැදුම් ලත්) වන්දනා කරනු ලැබේ. එසේම ඉන්දියාවේ හින්දු දහමේ ත්‍රිත්වයක් වශයෙන් බ්‍රහ්ම, ශිව සහ විෂ්ණු යන දෙවියන් තිදෙනා වන්දනා කරනු ලබත්.

ක්‍රිස්තියානි ත්‍රිත්වයේ වර්ධනයට තවත් විශාල රුකුලක් වූයේ ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ උගැන්වීම්ය. ප්ලේටෝගේ දර්ශනය මධ්‍යයේ වූයේ "නොදන්නා පියාණෝ" "වාක්‍යාණෝ" හෝ හේතුව, සහ "ලෝක ආත්මය" යෙන් සැදුම් ලත් ත්‍රිත්වයේ උගැන්වීම්ය. ඉතිහාසඥයෙකුගේ පහත සඳහන් උපුටාගැනීම, ත්‍රිත්ව ධර්මය වර්ධන කාලයේ ප්ලේටෝගේ දර්ශනය ජනතාව මත කොතරම් මහත් බලකිරීමක් ඇති කළේ දැයි පෙන්වයි.

"ප්ලේටෝ ඔහුම දෙවියන්ගේ හේතුව වන වාක්‍යයාණෝ ලෙස පෙනී සිටින්නට ඇතැයි සැකයක් ඇති කර ගත හැක. ඔහු සඳහා එය දේවශීර්ෂයේ ආරෝපණයක් ලෙස ........................ ප්ලේටෝවාදය විසින් ක්‍රමයෙන් බුද්ධිමත් පංතිය උරාගෙන තිබුනි. ......... (ප්ලේටෝගේ දර්ශනය) මිත්‍යා විශ්වාස නවීකරණය කරන්නට උත්සහා කරමින් තිබුන අතර, උසස් අභිරහස්වල ප්‍රධාන ප්‍රතිපත්ති ලෙස හඳුනාගනිමින් තිබුනි." (ඩී. මිල්මන් ක්‍රිස්තියානියේ ඉතිහාසිය , 2 වෙළුම 355 පිට)

ප්ලේටෝගේ ත්‍රිත්වය වැනි ග්‍රීක දර්ශන බුද්ධිමත් පංතිය අතර ජනප්‍රිය වූ අතර, මනා අධ්‍යාපනය ලද සහ බලවත් සභා නායකයන් විසින් එය සැනෙකින් පිළිගන්නා ලදී. ක්‍රිස්තියානි ත්‍රිත්වය සූත්‍රගත කරනු ලැබූයේ මේ නායකයෝය. ත්‍රිත්වධර්මය වර්ධනය කිරීමේ කාලය තුලදී ග්‍රීක දර්ශනය ක්‍රිස්තියානිය මත කෙතරම් බලවත් සහ ප්‍රයෝගාත්මක වූයේදැයි පහත සඳහන් උපටාගැනීමෙන් හුවා දක්වයි.

"මෙම ප්ලේටෝවාදී දර්ශනය, ක්‍රිස්තියානි යැයි හඟවාගැනීමට කැමති වූ එහෙත්, දාර්ශනික නාමය, සළුපිලි සහ තානාන්තර තබාගන්නට ප්‍රියකල ඇලෙක්සැඩ්‍රියාවේ උගතුන් වැනි අය විසින් ඇතිදැඩි කරගන්නා ලදී. විශේෂයෙන්ම, දෙවැනි සියවසේ ඇලෙක්සැඩ්‍රියාවේ ක්‍රිස්තියානි ශික්ෂණ වල මුලසුන ගත් සියල්ලෝ, ඇතෙනගොර්ස් පැන්ටේන්ස් සහ ක්ලෙමන්ස් ඇලෙක්සැන්ඩ්‍රියා මෙය අනුමත කළ බැව් කියැවේ. දෙවියන්ගේ මහානර්ග සහ නමස්කාරමය ත්‍යාගය වන සත්‍යය දර්ශනය, සෑම දාර්ශනික නිකායක් අතරම බිඳී විසිරී ඇති බැව් මෙම අය පිළිගන්හ: එම නිසා සෑම දෙසකින්ම මෙම කැබලි එක්රැස්කොට, ඒවා ආගම ආරක්‍ෂා කිරීමට යොදා ගැනීම, සෑම බුද්ධිමත්, විශේෂයන් ක්‍රිස්තියානි ගුරුවරයෙකුගේම යුතු කමක් විය." (ජේ. මෝශෙයිම්. දේව ආගමික ඉතිහාසයක්. වාල්ස්ටවුන් : 1694-1755:1:152)

පහත සඳහන් රූප සටහන් නොයෙක් ආගමික කණ්ඩායම්වල ත්‍රිත්ව, ප්ලේටෝගේ ඇතුලුව, සංක්‍ෂිප්ත කර ඇත.

**පුරාණ මෙසපොතේමියාව**




**පුරාණ බැබිලෝනිය**




**මිසර**





**හින්දු ධර්ම**




**ප්ලේටෝගේ දර්ශනය**




**ක්‍රිස්තියානි ත්‍රිත්වධර්මය**



## ත්‍රිත්වයේ ඉතිහාසය

ක්‍රිස්තියානිය මත මිත්‍යාවිශ්වාස සහ ග්‍රීක දර්ශනයේ බලපෑම, සභාවේ විවාද සහ බෙදීම් වලට හේතුවිය. ක්‍රිස්තියානි සභාව තුළ ඇතිවූ බෙදීම සමස්ථයකට පත් කිරීමේ ප්‍රයත්නයක් වශයෙන්, කොන්ස්තන්තිනු රෝම අධිරාජ්‍යා සභාවේ නායකයන්ගේ විශේෂ රැස්වීමක් කැඳවන ලදී. ක්‍රිස්තියානි ධර්මය කෙරෙහි මහා සැලකිල්ලක් කොන්ස්තන්තිනු හට නොතිබුනද, අගමික භේදය ඔහුගේ අධිරාජ්‍යට තර්ජනයක් බැව් ඔහු පැහැලිව තේරුම් ගත්තේය. ඔහු අණ කරන ලද රැස්වීම ක්‍රි. ව. 325 දී පැවැත් වූ අතර, එය නිසියා සංගායනාව ලෙස හඳුන්වනු ලැබීය. ක්‍රිස්තියානි ඉගැන්වීම් ගැන ඔහු තුළ තිබූ අල්ප දැනුම නොතකා, කොන්ස්තන්තිනු මෙම රැස්වීමට ක්‍රියාකාරීව සාකච්චාවලට මගපෙන්වූ අතර එහි මුලසුනද ගත්තේය.

ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පදාර්ථයෙන්ම සෑදී ඇති බැව් තීරණය කරන ලද්දේ මෙම නිසයා සංගායනාවේදීය. මෙම සංගායනාවේදී ලියන ලද ඇදහිලි ප්‍රකාශණයේ, ශුද්ධාත්මය දේවශීර්ෂයේ තැනන්වහන්සේ නමක් ලෙස සඳහන් කර නොතිබුණි. (එය පැමිණියේ පසුවය.) ඒ කෙසේ වෙනත්, ත්‍රිත්වයේ ධර්මයට පදනමක් දැමීමට මෙම රැස්වීම වැදගත් විය.

නිසියා සංගායනාවේ ගන්නා ලද තීරණ ඉවත හෙලූ සහ දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමාන බැව් පිළිගැනීම ප්‍රතික්ෂේප කල අය, කෙටි කාලයක් පැවතුනි. එසේ වුවත් තියඩෝසියස් අධිරාජ්‍යා ඔවුනට විරුද්ධව තීරණයක් ගනිමින් නිසියා සංගායනාව ස්ථිර කොට, තවත් සංගායනාවක් සඳහා කැඳවීමක් කරන ලදී. ක්‍රි. ව. 381 දී මෙම කොස්තන්තිනෝපල් සංගායනාවේදී ශුද්ධාත්මයාණන්, දෙවියන්වහන්සේ සහ ක්‍රිස්තුස්වහන්සේ සමඟ එකම තලයක වූ බැව් සභානායකයන් විසින් තීරණය කරන ලදී. පළමු වරට, ත්‍රිත්ව ධර්මය ඇතිවිය.

මෙම කොන්ස්තන්තිනෝපල් සංගායනාවට පසුව වුවද, එම ඉගැන්වීම් වළට විරුද්ධ බොහෝ අය සිටියද, ඔවුන්ගේ ඉදිරිපත් කිරීම නිසා, ඔවුන්ට ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු විය. ඇතනේසියන් විශ්වාසයේ ප්‍රකාශය ලෙස ත්‍රිත්වය වඩා සම්පූර්ණව විග්‍රහ කොට ඇත.

> "අපි ත්‍රිත්වයේ එකම දෙවියන් සහ ත්‍රිත්වයේ ඒකත්වය, තැනන්වහන්සේ ඒකාබද්ධ නොකොට, එමෙන්ම පදාර්ථ වෙන්කොට වන්දනා කරමු. මක්නිසාද, පියාණන්වහන්සේ එක් තැනන්වහන්සේ කෙනෙකුද, පුත්‍රයාණන් තවත් තැනන්වහන්සේ

කෙනෙකුද, ශුද්ධාත්මයාණන් තවත් තැනැන්වහන්සේ කෙනෙකුද හෙයිනි. නමුත් පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් දිව්‍යමය භාවය එකමය. මහිමය සමානය, රාජශ්‍රීය සමානය, පියාණන්ද, පුත්‍රයාණන්ද, ශුද්ධාත්මයාණන්ද එසේය. පියාණන් මවනු නොලැබීය. පුත්‍රයාණන් මවනු නොලැබීය, ශුද්ධාත්මයාණන් මවනු නොලැබීය. පියාණන් අනන්තය, පුත්‍රයාණන් අනන්තය, ශුද්ධාත්මයාණන් අනන්තය. පියාණන් සදාකල්ය, පුත්‍රයාණන් සදාකල්ය, ශුද්ධාත්මයාණන් සදාකල්ය. නමුත් එහි සදාකාලික තැනැන්වහන්සේලේ තිදෙනෙකු නොව, එක් සදාකාලික තැනැන්වහන්සේ කෙනෙකි. එසේම එහි මවනු නොලැබූ තැනැන්වහන්සේලා තිදෙනකු නොව, අනන්ත වහන්සේලා තිදෙනෙකු නොව එකම මවනු නොලැබූ සහ එකම අනන්ත වහන්සේ කෙනෙකි. ඒ සමානව පියාණන් සර්වබලධාරීය, පුත්‍රයාණන් සර්බලධාරීය සහ ශුද්ධාත්මයාණන් සර්වබලධාරීය. නමුත් එහි සර්වබලධාරී තැනැන්වහන්සේලා තිදෙනෙක් නොව, එක් සර්වබලධාරී තැනැන්වහන්සේ කෙනෙකුය. එසේ පියාණන් දෙවියන්වහන්සේය, පුත්‍රයා දෙවියන් වහන්සේය, ශුද්ධාත්මයාණන් දෙවියන්වහන්සේය. නමුත් එහි දෙවියන්වහන්සේලා තිදෙනෙකු නොව, එකම දෙවිකෙනෙක් පමණි. පියාණන් ස්වාමීන් වහන්සේය, පුත්‍රයාණන් ස්වාමීන් වහන්සේය, ශුද්ධාත්මයාණන් ස්වාමීන් වහන්සේය. නමුත් එහි ස්වාමීන් වහන්සේලා තිදෙනෙක් නොව එකම ස්වාමීන්වහන්සේ කෙනෙක් පමණි. ක්‍රිස්තියානි සත්‍යය මගින් එක් එක් තැනැන්වහන්සේ පැහැදිලිව දෙවියන්වහන්සේ සහ ස්වාමීන්වහන්සේ බැව් පවසන්නට අප බලකරන අතර, කතෝලික දහම තුළින් දෙවිවරුන් හෝ ස්වාමීන් තිදෙනකු සිටින බව ප්‍රකාශ කිරීම අපට තහනම් කර ඇත. පියාණන් කිසිවකු විසින් නොසැදූ අතර මවනු නොලැබූවේය, උපත නොලැබූවේය. පුත්‍රයාණන් පියාණන්ගෙන් පමණි, නොසාදන ලදී, නොමවනු ලදී, නමුත් ජාතකවය. ශුද්ධාත්මයාණන්, පියාණන් සහ පුත්‍රයාණන් විසින් නොමවන ලදී, ජාතක නොකරන ලදී. නමුත් නික්මයන්නේය. එම නිසා සිටින්නේ එක පියාණන්කෙනෙකි, පියාණන් තිදෙනෙකු නොවේ, එක් පුත්‍රයාණන් කෙනෙකි, පුත්‍රයාණන් තිදෙනෙකු නොවේ: එක් ශුද්ධාත්මයකි, ශුද්ධාත්ම තිදෙනෙකු නොවේ. මේ ත්‍රිත්වයේ පූර්වයක් හෝ පශ්චිමයක්, ශ්‍රේෂ්ඨ හෝ අල්ප, නොමැති නමුත් වහන්සේලා තිදෙනාම ඔවුනොවුන්ට සහ-සදාකල් සහ සහ-සමානය. සියල්ල තුළින් , ඉහත කී ලෙස, ත්‍රිත්වයේ ඒකත්වය සහ ඒකත්වයේ ත්‍රිත්වය

දෙකම ගෞරව කල යුතුය. ගැලවීමට ලැදි කවුරුන්හෝ, ත්‍රිත්වය ගැන එසේ සිතිම යෙහෙකි."

මෙම ප්‍රකාශයේ සංකිර්ණභාවය තිගැස්සෙන සුලුය. ක්‍රි.ව. 381 දී කොන්ස්තන්තිනෝපල් සංගායනාවට පසුව වාර්තා කල ඇතනේසියන් ප්‍රකාශය සහ ක්‍රි.ව. 150 පමණ වු "අපෝස්තලික විශ්වාස ප්‍රකාශනය" සසඳා බලන්න:

"සර්වබලධාරී දෙවියන්වහන්සේ කෙරෙහිද,
උන්වහන්සේගේ පුත්‍රවූ අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් කෙරෙහිද,
උන්වහන්සේ ශුද්ධාත්මයාණන් සහ කන්‍යමරියාගෙන් උපත ලද බවද විශ්වාද කරමි.
උන්වහන්සේ පොන්සියු පිලාත් යටතේ කුරුසිගත කොට තැන්පත් කලහ.
තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිට ස්වර්ගයට නැගි,
පියාණන්ගේ දකුණු පසෙහි වැඩ සිටින සේක.
එහි සිට පිවතුන්ද, මළවුන්ද විනිශ්චය කරන්නට නැවත වඩින සේක.
ශුද්ධාත්මයාණන් කෙරහිද , ශුද්ධසභාව කෙරෙහිද
මළවුන්ගේ නැවත නැගිටීම කෙරෙහිද,
සදාකාල පිවිතය කෙරෙහිද විශ්වාස කරමි.

ඇදහිල්ලේ වෙනස් වීම, යට පෙනෙන සේ සංක්ෂිප්ත ගතකල හැකිය.

| <u>අපෝස්තුලුවරුන්ගේ ප්‍රකාශය</u> | | <u>ඇතනේසියන් ප්‍රකාශය</u> |
|---|---|---|
| සර්වබලධාරී දෙවියන්වහන්සේ | → | පියාණන් වන දෙවියන් වහන්සේ |
| ඔහුගේ එකම පුත්‍ර යේසුස්ක්‍රිස්තුස් | → | පුත්‍රයාණන්වන දෙවියන් වහන්සේ |
| ශුද්ධාත්මය මගින් උපත ලද | → | ශුද්ධාත්මය වන දෙවියන්වහන්සේ |

## ත්‍රිත්වයේ වඩා මෑත ඉතිහාසය

ක්‍රිස්තියානි ඉතිහාසයේ බොහෝ දුරට, ත්‍රිත්වධර්මය ප්‍රතික්ෂේප කිරීමට දඬුවම වුයේ මරණයයි. උදාහරණයක් ලෙස, ත්‍රිත්වය ඉගැන්වීමට

විරුද්ධවන ඕනෑම කෙනෙකුට මරණ දඬුවම අනිවාර්ය කිරීමේ පනතක් 1648 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සම්මත කළේය. 1813 වන තුරුම ත්‍රිත්වයට විරුද්ධ වන්නන්ට පැනවූ මරණ දඬුවම බ්‍රිතාන්‍ය නීතියෙන් ඉවත් කරනු නොලැබීය.

මේ යුගයවල් තුළ, ත්‍රිත්වයේ ඉගැන්වීම් ප්‍රතික්ශේප කරමින් එය බයිබල් නොවන උපතකින් හඳුන්වාදෙන ලදැයි කියමින් ජීවිතය පරදුවට තැබුවෝ සිටියහ. බයිබලයේ සත්‍යය තුළ ඔවුන්ගේ විශ්වාසය කෙතරම් ශක්තිමත් වීද, ක්‍රිස්තුස් වහන්සේට වසර කිහිපයකට පසුව හඳුන්වාදුන් වැරදි ඉගැන්වීම පිළිගන්නවාට වඩා මිය යාමට ඔවුන් කැමති විය.

## මෙය සිදුවූයේ කෙසේද?

මිත්‍යා රෝමය මත ක්‍රිස්තියානිය බලපෑමෙන්, බොහෝ මිත්‍යා උගැන්වීම් ක්‍රිස්තියානිය තුළට අවශෝෂණය වූ අතර, පළමුවෙනි සියවසේ පිරිසිදු ක්‍රිස්තියානි උගැන්වීම් දූෂණය විය. බොහෝ අය නාමිකව ක්‍රිස්තියානියට පරිවර්තනය වුවද, ඔවුන් තවමත් ඔවුන්ගේ මිත්‍යා ආභාෂය සහ විශ්වාස වල එල්බ සිටියහ. පල්ලිය මෙම අලුත් විශ්වාස පිළිගන්නා අය සඳහා මධ්‍යස්ත ගිවිසුමක් කළ අතර, ක්‍රිස්තියානිය සමඟ බොහෝ උගැන්වීම් සහ අදහස් මිශ්‍ර කිරීමට අවසර දෙන ලදී. ක්‍රිස්තියානි චින්තනය තුළට ඇතුලු වූ බයිබල-නොවන අදහස් වලින් වඩාත්ම පැහැදිලි දෙය ත්‍රිත්වය වේ.

## දෙවියන්වහන්සේ මෙසේ වීමට ඉඩහැරියේ කෙසේද?

බොහෝ ක්‍රිස්තියානින්ට මෙවැනි දෙයක් සිදු වීමට දෙවියන්වහන්සේ ඉඩදීම නොසිතිය හැකි දෙයකි. නමුත් එය එසේ නොවිය යුතුය. දෙවියන්වහන්සේගේ ජනතාව වූ ඊශ්‍රායෙල්, දෙවියන්ගේ උගැන්වීමෙන් නැවත නැවතත් බොහෝ ව්‍යාජ ආගමික අභ්‍යාස (ප්‍රතිමා වන්දනාව ඇතුළුව) වලට හැරුණු හැටි පැරණි ගිවිසුම පවසයි. අලුත් ගිවිසුමේ විශ්වාසකයින් වඩා හොඳ වන්නේ කෙසේද?

ඇත්ත වශයෙන්ම දෙවියන්වහන්සේ එය සිදුවීමට අවසර දුන්නා පමණක් නොව, සත්‍යවේ උගැන්වීම් දූෂණය වන බවද උන්වහන්සේ බයිබලයේ අවවාද කරයි.

> "කිසිවෙකුට කිසිසේත් නුඹලා රවටන්නට ඉඩ නාරිල්ලා, මක්නිසාද ඇදහිල්ලෙන් වැටීයාමත් පළමුවෙන් වුනොත් මිස එය නොපැමිණෙන්නේය." (2 තෙසලෝනික 2:3)

"මාගේ පිටත්ව යාමෙන් පසු රැළට අනුකම්පා නොකරන රෞද්‍රවූ වෘකයන් නුඹලා අතරට පැමිණෙන බව දනිමි. නුඹලා අතරෙන්ම මනුෂ්‍යයෙක් නැගිට, තමුන් පස්සේ යන්ට ගෝලයන් ඇදගන්නා පිණිස කාරණා පෙරළා කථාකරනවා ඇත." (ක්‍රියා 20:29-30)

"මක්නිසාද, ඔවුන් සාරවත් ඉගැන්වීම් නොඉවසා, කසන කන් ඇතිව, තමුන්ගේ ආශාවල් ලෙස තමුන්ටම ගුරුවරුන් රැස්කරගෙන, සත්‍යයට කන් නොදී, ප්‍රබන්ධවලට හැරියන කාලය පැමිණෙන්නේය." (2 තිමෝති 4:3-4)

"සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද බොහෝ සිටියෝය.............. ඔවුන්ගේ සල්ලාලකම් අනුව බොහෝ දෙනෙක් යනවා ඇත. ඔවුන් නිසා සත්‍යතාවේ මාර්ගයට අපහාස පැමිණෙන්නේය."
(2 පේත්‍රුස් 2:1-2)

"බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින බැවින්....."
(යොහන් 4:1-3)

මෙම වදන් ලියා වසර 2000 කට පමණ පසු ජිවත්වන අප හට, ඉතිහාසය දෙස ආපසු හැරී බලා ක්‍රිස්තියානි ධර්මයේ සිදු වූ වෙනස්කම් දැකීමේ හැකියාව ඇත. බයිබලයේ සඳහන් අවවාද සත්‍යය යැයි අදහනවා නම්, මේ වෙනස්කම් හඳුනාගෙන, ඒවා ප්‍රතික්ෂේප කොට සත්‍ය ක්‍රිස්තියානියට නැවත හැරීමේ හැකියාවක් අපට තිබිය යුතුය. අප සත්‍යය අදහන්නේය යන්නට එකම සහතික මග අප විසින්ම බයිබලය ප්‍රවේසමෙන් අධ්‍යනය කිරීමයි. අප පූර්ණ බයිබලයම කියවීමට ප්‍රවේසම් විය යුතු අතර, අපගේ පවත්නා ඇදහිලිවලට සුදුසු හුදකලා පද සෙවීම නොකළ යුතුය.

ත්‍රිත්වය තුළ අවංකව විශ්වාස කරන බොහෝ ක්‍රිස්තියානින්, එම ධර්මය හැඩ ගැස්වූ බයිබලයට පිටින් වූ බොහෝ බලපෑම් ගැන හැඟීමකින් තොරය. ඔවුන්ගේ ඇදහිලි ස්ථිර කිරීමේ උත්සහයක් වශයෙන් ඔවුන් නිතරම හුදකලා පද සාකච්චා කරමින් එම පද ලියැවූ පද සම්බන්ධය නොසලකා හරිනු ලබයි. උදාහරණයක් මෙන්න.

## මමද මාගේ පියාණන් වහන්සේද එකමය.

"මමද පියාණන්වහන්සේද එකමය" (යොහාන් 10:30)

මෙම පදය අපි හුදකලාව ගත්තේ නම්, ශුද්ධාත්මයාණන් සඳහන්

නොකෙරුණත්, යොහන් ත්‍රිත්ව ධර්මයට සහය දුන් බැව් සිතීමට අපට පුළුවන.

මෙම පදය ත්‍රිත්ව ප්‍රකාශනයක් කිරීමේ ගැටළුව වන්නේ "එකමය" යන්න බයිබල් භාෂාවෙන් එකම පුද්ගලයා නොවන බවයි. එහි අරුත එකඟවීමයි.

> "<u>ඔවුන් සියල්ලන් ඒකත්වයක් වන පිණිස,</u> පියාවූ ඔබ මා තුළෙහිද, මා ඔබ තුළෙහිද සිටින්නාක්මෙන්ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාස කරන පිණිසත්, අප තුළ ඔවුන් ඒකත්වයක් වන පිණිසත්." (යොහන් 17:21)

පද සම්බන්ධයේදී, පරිච්ඡේදයේ ඉතිරි කොටස කියවන විට, යේසුස්වහන්සේ කොහෙත්ම තමන් දෙවියන්වහන්සේ ලෙස ප්‍රකාශ නොකරන බැව් පෙනේ. එයට ප්‍රථම පදයේ, තමන් දෙවියන්වහන්සේට සමාන නැති බැව් යේසුස් වහන්සේ පැහැදිළිව පවසයි:

> "<u>ඔවුන් මට දුන්නාවූ මාගේ පියාණන්වහන්සේ සියල්ලන්ටම වඩා උතුම්ය.</u> පියාණන්වහන්සේගේ අතින් ඔවුන් උදුරාගන්ට කාටවත් බැරිය." (යොහන් 10:29)

යේසුස් වහන්සේට වෛර කළ, උන්වහන්සේ මැරීමට අවස්ථාවක් බලමින් හුන් යුදෙව්වන්, උන්වහන්සේ දෙවියන්වහන්සේට සමාන කරගනිමින් දේව අපහාස දොඩවන්නේ යැයි චෝදනා කළහ :

> "යුදෙව්වරු උන්වහන්සේට උත්තරදෙමින් : අප නුඹට ගල්ගසන්නේ යහපත් ක්‍රියාවක් නිසා නොව දේව අපහාසය නිසාය. මනුෂ්‍යයෙක්වූ නුඹ දෙවියන්වහන්සේ වෙන්ට සාදන නිසායයි කීවෝය."
> (යොහන් 10:33)

මෙය ඔවුන්ගේ චෝදනාව විය. නමුත් ඇත්ත වශයෙන්ම යේසුස්වහන්සේ දේව අපහාසය නොකළේය. උන්වහන්සේ තමන් දෙවියන්වහන්සේ යැයි නොකිය. ඊළඟ පදයේ යේසුස්වහන්සේ ඔවුන් නිවැරදි කරමින් :

> "යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : නුඹලා දෙවිවරුයයි මම කීමියි නුඹලාගේ ව්‍යවස්ථාවෙහි ලියා තිබෙනවා නොවේද? (ලියවිල්ල කඩවෙන්ට බැරිය.) දෙවියන්වහන්සේගේ වචනය

ලැබූවන්ට දෙවිවරුයයි උන්වහන්සේ කීසේක් නම්, මම දෙවියන්වහන්සේගේ පුත්‍රයා වෙමියි මා කී නිසා පියාණන්වහන්සේ විසින් කැපකොට ලෝකයට එවන ලද තැනැත්තා ගැන - නුඹ දෙවියන්වහන්සේට අපහසකරන්නෙහියයි නුඹලා කියවුද? මම මාගේ පියාණන්වහන්සේගේ ක්‍රියා නොකරම් නම්, මා විශ්වාස නොකරල්ලා. නමුත් ඒවා කරම් නම්, නුඹලා මා විශ්වාස නොකරත් පියාණන්වහන්සේ මා තුළෙහිද, මා පියාණන්වහන්සේ තුළෙහිද සිටින බව දැන තේරුම් ගන්නා පිණිස ක්‍රියා විශ්වාසකරපල්ලා යයි කීසේක."
(යොහන් 10:34-38)

"නුඹලා දෙවිවරු යැයි මම කීමියි" නුඹලාගේ ව්‍යවස්ථාවෙහි ලියා තිබෙනවා නොවේද" යන්න යේසුස්වහන්සේ කීවිට, ඔහු උපමා දැක්වූයේ ඊශ්‍රායෙලයේ දිව්‍යමය පත්වීම් ලද පූජකයන් සහ වැඩිහිටියන්ට "දෙවියන්" යන තානාන්තරය දී තිබූ ගීතාවලිය 82 යි. ඔවුනට මේ තානාන්තරය දී තිබුනේ ඔවුන් දෙවියන්වහන්සේ වෙනුවෙන් පෙනී සිටි නිසා සහ දෙවියන්වහන්සේගේ නාමයෙන් කතා කළ නිසාය. යේසුස් වහන්සේ පවසන්නේ, "පරණ ගිවිසුමේ මිනිසුන් "දෙවියන්" යැයි හැඟවූයේ නම් මම දෙවියන්ගේ පුත්‍රයා යැයි සරලව කියන විට ඔබ කලබල වන්නේ ඇයි" කියාය.

යොහන්ගේ ඉතිරි ලියවිලි, පොතේ ඉතිරිය සහ පරිච්චේදයේ ඉතිරිය සමඟ මෙම පදය පදසම්බන්ධය කරන විට, යේසුස්වහන්සේ උන්වහන්සේ දෙවියන්වහන්සේ සමඟ එක් සිතකින් සිටි බැව් කියන වග පැහැදිලි වේ.

"පියාණන්වහන්සේ මා හඳුනන්නාක් මෙන්ද, මා පියාණන්වහන්සේ හඳුනන්නාක් මෙන්ද (යොහන් 10:14)

යේසුස්වහන්සේ පියාණන් සමඟ ඒකත්වයෙන් මෙන්, අපටද යේසුස් වහන්සේ සහ පියාණන් සමඟ ඒකත්වයෙන් සිටීමට පුලුවන.

## පටන්ගැන්මෙහිදී වාක්‍යයාණෝ සිටීසේක.

යොහන්ගේ පළමුවැනි පරිච්චේදයේ අපි පහත සඳහන් වචන කියවමු.

"පටන්ගැන්මේදී වාක්‍යයාණෝ සිටීසේක. වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ හා සමඟ සිටීසේක. වාක්‍යයාණෝ

දෙවියන්වහන්සේව සිටිසේක. උන්වහන්සේ පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ සමඟ සිටිසේක. උන්වහන්සේ කරණකොටගෙන සියල්ල සාදන ලද්දේය." (යොහන් 1:1-3)

මුළු බයිබලයේම මෙතරම් විරුද්ධත්වයකට හේතු වූ තවත් පදයක් සමහර විට නොමැති තරම්ය. එසේ වන්නේ නිසැකවම මෙ දුශ්කර පදයක් නිසාය. කෙසේ නමුත් පදයේ වඩාත් ජනප්‍රිය තේරුම්ගැනිම මෙවැන්නක් වෙයි.

"පෘතුවිය මැවීමේදී ක්‍රිස්තුස්වහන්සේ සිටියහ. ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ සමඟ විය, සහ ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ විය. ආරම්භයේදී දෙවියන්වහන්සේ සමඟ එසේම විය. මුළු පෘතුවියම ඔහු විසින් සාද ලදී. (යොහන් 1:1-3 භාවාර්ථ දැක්වීම)

ඉහත දැක්වූ උපුටා ගැනිම භාවාර්ථ දැක්වීමකි. බොහෝ දෙනා ඉතා විශ්වාසදායක යැයි පිළිගන්නා පරිසමාප්ත නොවන පරිවර්තනයකි. කෙසේ වෙතත් එය සියල්ලෝ නැතත්, බොහෝ දෙනා යොහන් 1:1 කියවන ආකාරය ප්‍රතිබිම්බ ගත කරයි

ඉහත භාවාර්ථ දැක්ම කියැවීමේදී ප්‍රශ්නාත්මක දේ හතක් ඇත.

යොහන්ගේ සුභාරංචියේ ප්‍රස්ථාවනාව කාව්‍යයකි. (යොහන් 1:1-18) මෙය පැහැදිලි දේ සඳහන් කිරිමක් වුවත්, පදය තේරුම් කිරීමේදී මතක තබා ගැනිම වැදගත්ය.

1. යොහන්ගේ "පටන්ගැන්මේදී" පැහැදිලිවම කෙසේ හෝ උත්පත්ති 1:1 හි "පටන්ගැන්මේදී......" හට සම්බන්ධ වුවත්, 1 යොහාන් 1:1 හි සමඟ සසඳන විට (යොහන්ගේ සුභාරංචිය සමඟ එකට තිබූ ලිපියක් විය හැකියි.) යොහන් කතා කරන "පටන්ගැන්ම" පෘතුවියේ ආරම්භය ගැන සැලකිල්මත් නොවන අතර එය අපෝස්තුලුවරුන් සාක්ෂිදරණ සුභාරංචියේ පටන්ගැන්ම ලෙස පෙනෙයි. (මාර්ක් 1:1, ලූක් 1:2 , යොහාන් 6:64 , 8:25 , 5:27 , 16:4 , 1 යොහන් 1:1 , 2:7 , 13 , 24 , 3:11 , 2 යොහන් 5:6 පදවල "පටන්ගැන්මේදී" නමැති එකම ග්‍රීක වදන යොදා ඇති අයුරු සසඳන්න.)
උත්පත්ති 1:1 පටන්ගැන්මේදී වෙනුවට, උත්පත්ති "පටන්ගැන්ම" සහ ඔහුගේ අලුත් ගිවිසුමේ සඳහන් වඩා වැදගත් අලුත් "පටන්ගැන්ම" සමඟ යොහන් සංසන්දනයක්කරයි. "පටන්ගැන්ම"

ක්‍රිස්තුස්වහන්සේගේ නාමයක් බවත් මතැන සටහන් කිරීම වටී. (කොලොස්සි 1:15 , එළිදරව් 3:14 , 21:6 , 22:13)

2. "වාක්‍යයාණෝ සිටිසේක්: යොහන්ගේ "වාක්‍යයාණෝ" ක්‍රිස්තුස්වහන්සේට පැහැදිලිවම ආසන්න වශයෙන් සම්බන්ධ වී ඇතත්, "වාක්‍යයාණෝ" යේසුස්වහන්සේට තවත් නමක් නොවේ. යොහාන්ට උවමනාවුයේ "පටන්ගැන්මේදී" යේසුස්ක්‍රිස්තුස් විය යන්න ලියන්නට නම්, ඔහුට එසේ කරන්නට තිබුනි. තවද "වාක්‍යයාණෝ" මෙතැන එක් සුවි වදනක් පමණක් බැව් නිතරම නොසලකා හරී : "ජිවනය" (4 පදය) සහ "ආලෝකය" (7-9 පද) යොහන් කතාකරන තවත් කොටසක් වේ. මේ එකදු වචනයක්වත්, "වාක්‍යයාණෝ" "ජිවනය" "ආලෝකය" , නාසරෙත්හි යේසුස්ගේ නාමයට සරල ආදේශ නොවේ.

3. "වාක්‍යයාණෝ" දෙවියන්වහන්සේ සමඟ සිටි සේක. මුල් බයිබල් භාෂාවන් පිළිබඳ දැනිමක් නොමැතිව වුවද පසුව සඳහන්වන දේ සරලව ජනතාව කියවීමට කැමති "යේසුස් = දෙවියන්වහන්සේ" නමැති ප්‍රකාශය නොවන බැව් පැහැදිලිය. මක්නිසාද <u>වාක්‍යයාණො</u> යේසුස්වහන්සේ නම් ඔහුට ශාරීරිකව "දෙවියන්වහන්සේ හා සමඟ" (සමහරවිට දෙවියන්ගේ දකුණු පසින්) සිටින්නට නොහැකි වන අතර, එම අවස්ථාවේදීම "දෙවියන්වහන්සේව" සිටින්නට නොහැකි වනු ඇත.

4. "..............වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව සිටිසේක." මෙම වාක්‍ය කණ්ඩය සතු එකම පරිවර්ථනය මෙය නොවේ. විකල්ප ඉදිරිපත් කිරීම් වල "දෙවියන්වහන්සේ කුමක් විද, වාක්‍යයාණෝ එසේ විය." "වාක්‍යයාණෝ දිව්‍යමය විය." සහ එවැනි දේ සඳහන්ය. නමුත් යොහන් 10:34-35 දී යේසුස් වහන්සේ විසින්ම දෙන "දෙවියන්"නමැති වචනයේ තේරුම අප මතක තබා ගන්නේ නම් (කලින් සඳහන් කළ), මෙය බොහෝ දෙනා සිතන පරිදි ත්‍රිත්ව ප්‍රකාශය නොවන්නට පුලුවන.

5. "උන්වහන්සේ ................" "එය" නමැති වචනය වෙනුවට "උන්වහන්සේ" නමැති වචනය බයිබල් පරිවර්තකයින්ගේ මිස යොහන්ගේ නොවේ. අනෙක් පද සම්බන්ධවලදී "වාක්‍යයාණෝ" යන්නට යෙදෙන "එය" යන සර්වනාමයේ වෙනසක් ඇත. ['the word' හි කැපිටල් w ගැනත් මෙය සත්‍යයකි. මෙය මුල් කෘතියෙහි නොමැත. පරිවර්තකයන් "උන්වහන්සේ" (He) සහ 'Word' යන්නට කැපිටල් අක්ෂරයක් දීම පුදුම සහගතය] නමුත්

"ජීවනය" සහ "ආලෝකය" යන්නට සැමවිටම එසේ නොකරයි. මෙය යොහන් විසින් කළ වෙනස් කිරීමක් නොවේ.

6. "...................... පටන් ගැන්මේදී දෙවියන්වහන්සේ සමඟ සිටිසේක්" : මෙය යොහන්ගේ පළමු "දෙවියන්වහන්සේ සමඟ" ප්‍රකාශයේ නැවත කියවීමකි. නමුත් වෙනස් වචනවලින් මෙහිදී යොහන්ගේ නැවත නැවත කීමේ අවධාරණය වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ සමඟ සිටිනු හෝ, දෙවියන්ගෙන් වෙනස් වූ දෙයක් බැව් බොහෝ විට නොසලකා හරිනු ලැබේ. වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ සමඟ අනන්‍ය නොකිරීමට යොහන් ප්‍රවේශමෙන් වචන තෝරා ගනී. වඩා වැදගත්ම, යොහන් 1:2 දී, කාලයේ සාධකය නැවත පවසයි. වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ සමඟ සිටියේ කවදාද? "පටන්ගැන්මේදීය" - මාර්ක් 1:1 පටන්ගැන්මේදී මිස, උත්පත්ති 1:1 නොවේ.

7. "උන්වහන්සේ කරණකොට ගෙන සියල්ල සාදන ලද්දේය"..... මෙය පද සම්බන්ධයට ප්‍රධාන යතුරකි. යොහන්ගේ අනෙකුත් ලියවිලි සමඟ මෙය සැසඳීමේදී, "සියල්ල" යනුවෙන් මෙතැන යොහන් සැලකිලිමත් වන්නේ උත්පත්ති පොතේ පැලෑටි සහ සත්වයෝ හට පමණක් නොවන බව අපට පෙනේ. මෙතැන ඔහුගේ අනෙකුත් ලියවිලිවල මෙන් ඔහු සැලකිලිමත් වන්නේ අලුත් ගිවිසුමේ සොයාගත හැකි "අලුත් මැවිල්ලක්" කෙරෙහිය. එය උත්පත්ති පොතේ මැවිල්ලට වඩා බොහෝ වෙනස්ය. කොලෙස්සි 1:16 සහ එපිස 3:9 යේදී පාවුල් එවැනිම භාෂාවක් යොදාගෙන ඇති අතර එම දෙතැන්හිදීම පාවුල්ගේ පද සම්බන්ධය සැසඳීමේදී, ඔහු සඳහන් කරන මැවිල්ල ක්‍රිස්තුස්වහන්සේ කරණකොට ගෙන සිදු වූ බව පෙනේ. (කොලොස්සි 1:15-18 , 3:9-10 සහ එපිස 2:10, 3:10, 4:24 සසඳන්න). මෙම අලුත් මැවිල්ල නැවත උපන් අලුත් මිනිසුන් සහ ස්ත්‍රීන් ගැන මිස, දූවිල්ලෙන් උපතලද ආදම් සහ ඒවගේ පැරණි මැවිල්ල සමඟ කිසිදු ගණුදෙනුවක් නැත. (2 කොරින්ති 5:17, ගලාති 6:15, ජේම්ස් 1:18, එළිදරව් 3:14 සසඳන්න.)

## ලොගෝස්

යොහාන් 1:1-3 නිවැරදි තේරුම් ගැනීම, පද සම්බන්ධයේදී "වාක්‍යයාණෝ" තේරුම් ගැනීම මත රඳා පවතී. "ලෝගෝස්" නමැති ග්‍රීක වචනය (යොහන් 1 දී වාක්‍යයාණෝ ලෙස පරිවර්තනය කොට ඇත.) "යේසුස්" යන තේරුම ගෙන නොදෙයි. "ලෝගෝස්" නමැති වචනය:

විස්තරය, සංනිවේදනය, අභිප්‍රාය, බුද්ධිය, සුභපැතිම, හේතුව, ධර්මය, දේශනා කිරීම සහ කිම ලෙස බයිබලයේ අනෙක් තැන්වල පරිවර්තනය කොට ඇත.

"ලෝගෝස් - සංකල්පයක් හෝ සිතුවිල්ලක් මූර්තිමත් කරන, ජීවත්වන කඩහඬකින් මතුරන, වචනයක්." (ස්ට්‍රෝංග් වැඩි දියුණු කරන ලද ශබ්දකෝෂය, ඕක් හාබර්, වොෂිංටන් : 1995)

අප තවදුරටත් ස්ට්‍රොංගේ ග්‍රීක ශබ්දකෝෂයේ කියවන්නේ : "වෙනස්වන විශ්වයක් සමභාවයට ගෙන එන දිව්‍යමය හේතුව හෝ සැලැස්ම හැඟවීමට ලෝගෝස් යන වචනය ක්‍රි. පූ. 600 දී පමණ ග්‍රීක දාර්ශනිකයකු වූ හෙරක්ලිටස් පළමුවරට පාවිච්චි කළේය. යොහන් 1 හිදී, යොහන්ගේ අභිප්‍රායට මෙම වචනය මනාසේ සුදුසු විය." (ස්ට්‍රෝංගේ වැඩි දියුණු කරන ලද ශබ්දකෝෂය, ඕක් හාබර් වොෂිංටන්, 1995)
අභ්‍යන්තර සිතුවිලි (දිව්‍යමය හේතුවක්) බාහිරව වචනයේ ප්‍රකාශ කිරීම හෝ වෙනත් සංනිවේදනයක් "ලෝගෝස්" වචනයෙන් නිර්දේශ කළ හැක. පටන්ගැන්මේදී දෙවියන්වහන්සේට මෙම අභ්‍යන්තර සිතුවිල්ල තිබුණි. උන්වහන්සේගේ එකායන අභිප්‍රාය මධ්‍යගත වුයේ ක්‍රිස්තුස් තුළය. ක්‍රිස්තුස්වහන්සේ උපන් විට, මෙම "වචනය" මාංශය සහ රුධිරය බවට පත්විය. යේසුස්වහන්සේ "වාක්‍යයාණෝ මාංශමත්වූ" තැනැත්තාය. (යොහන් 1:14) පටන් ගැන්මේදී දෙවියන්වහන්සේගේ සිත තුළ වූ සිතුවිල්ල, අභිප්‍රාය, හේතුව (ලෝගෝස්) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නමැති පුද්ගලයා තුළ බාහිරව ප්‍රකාශ විය.

"වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව සිටිසේක්" ගැන කුමක්ද? "වාක්‍යයාණෝ" දෙවියන්වහන්සේගේ අභ්‍යන්තර සිතුවිල්ල හෝ අභිප්‍රාය ලෙස සිහියේ තබා ගනිමින් , අපි හිතෝපදේශයේ කියවමු :

"මක්නිසාද, තමාගේ සිතෙන් ගණන්ගන්නා ලෙසට ඔහු (මිනිසෙක්) වන්නේය. (හිතෝපදේශ 23:7)
දෙවියන්වහන්සේ ගැනත් එය සත්‍යය. දෙවියන්වහන්සේ සිතන ලෙස උන්වහන්සේ වන්නේය. එම නිසා දෙවියන්වහන්සේගේ සිතුවිලි (උන්වහන්සේගේ "ලෝගෝස්") දෙවියන්වහන්සේමය. "වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව සිටි සේක."

"කිසිවෙක් කිසි කලෙක දෙවියන්වහන්සේව දුටුවේ නැත. අපි එකිනෙකාට ප්‍රේම කරමු නම්, දෙවියන්වහන්සේ අප තුළ සිටින

සේක. උන්වහන්සේගේ ප්‍රේමයද අප තුළ සම්පූර්ණව් තිබේ. ...... යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව යමෙක් ඒත්තුගන්නේද, දෙවියන්වහන්සේ ඔහු තුළත් ඔහු දෙවියන්වහන්සේ තුළත් ඇත්තේය. ................ දෙවියන්වහන්සේ ප්‍රේමයයි, ප්‍රේමයෙහි පවත්නා දෙවියන්වහන්සේ තුළ සිටි, දෙවියන්වහන්සේද ඔහු තුළ සිටින සේක. (1 යොහාන් 4:12-16)

## සමාප්තිය

දෙවියන්වහන්සේගේ වචනයේ පිටු අතර, අපගේ ගැළවීමට අවශ්‍යය සියලුම තොරතුරු අපට ඇත. සත්‍යයේ ප්‍රභවය මෙයම පමණි.

"ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන ගැළවීම පිණිස නුඹ නැණවත්කරන්ට පුළුවන් වූ ශුද්ධ ලියවිලි නුඹ බාල වයසේ පටන් දැනගෙන සිටින බවත් දැන, ඒවායේ පිහිටා සිටපන්න. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ."
(2 තිමෝති 3:15-17)

අපි පැරණි සහ අලුත් ගිවිසුම් වල පිටු පුරා කියවනන්නෙමු :

- දෙවියන්වහන්සේ සර්ව බලධාරී මැවුම්කාරයාණෝය. පියාණෝ සහ එකම සත්‍යවූ දෙවියන්වහන්සේය.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණෝය, ශුද්ධාත්මයේ බලය මරියා වෙත පැමිණ ඇය පිළිසිඳවත් කර, ඇයගෙන් උපත ලදහ.

## ත්‍රිත්වයේ මහා ගැටළු තුන.

දෙවියන්වහන්සේ ත්‍රිත්වයක් නම්, ඔහුගේ පොතවන බයිබලයේ ඔහු අප හට ඒ බැව් නොපැවසුවේ මන්ද?

යේස්සුවහන්සේ දෙවියන්වහන්සේ සමඟ සහ-සමාන නම්, උන්වහන්සේ "පියාණන්වහන්සේ මට වඩා උතුම්ය." යැයි කිවේ ඇයි?

අපෝස්තුලුවරුන්ගේ මරණයෙන් වසර සිය ගණනකට පසු, වැදගත් ධර්මයක් වර්ධනය කිරීමට හැකිවූයේ කෙසේද?

දෙවියන්වහන්සේගේ වචනයේ පැහැදිලිව වාර්තාගත නොමැති ධර්මයක් අප විශ්වාස කළ යුත්තේ ඇයි?
විශේෂයෙන්ම අපට මෙසේ අවවාද කර තිබියෙදී :

"නුඹලා පිළිගත් සුභාරංචිය හැර වෙන සුභාරංචියක් යමෙක් නුඹලාට දේශනාකරතොත් ඔහු ශාපලද්දෙක් වේවා............"
(ගලාති 1:9)

ත්‍රිත්වයේ ධර්මය ප්‍රතික්ෂේප කිරීම වනාහි බොහෝ සභාවල් තුළ ඔබ පිළිනොගන්නා ස්ථාවරයක පිහිටීමකි. කෙසේ නමුත්, මෙම සභාවල් ත්‍රිත්වය පිළිබඳ උගන්වන්නේ එය බයිබලයේ අඩංගු නිසා නොව, මුළු මහත් ක්‍රිස්තියානි ලෝකය මතම 4 වන සියවසේදී එය බලයෙන් පැටවූ නිසාත්, එතැන් පටන් බොහෝ සියවස් ගණනාවක් එම ධර්මය ගැන ප්‍රශ්න කිරීම දැඩි හිරි හැර වලින් දැඩුවම් ලද නිසාත්ය. අද බොහෝ දෙනාගේ ප්‍රතික්‍රියාව දැඩි හිරි හැර නොව භාවමය ප්‍රතිචාරයකි - හෙලා දැකීම, බිය හෝ කුපිතය - මුහුණ දීමට ලෙහෙසි වුවත්, අප්‍රසන්න සහ තර්ජනාත්මක දේවල්ය.

ක්‍රිස්තුස්වහන්සේගේ කාලයේ සැබෑ විශ්වාසවන්තයෝ සුළු පිරිසක් වූ අතර, ඔවුන් සහ අප පහත දැක්වෙන වදන්වලින් එතුමා ධෛර්යවත් කරනු ලබයි.

> "පටු දොරටුවෙන් ඇතුල්වෙයල්ලා , මක්නිසාද විනාශයට යන දොරටුව විශාලය. පාරත් පළලය, එයින් ඇතුල්වන්නෝද බොහෝය. මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය, පාර අවහිරය, ඒක සම්භවන්නේ ස්වල්ප දෙනෙකුටය." (මතෙව් 7:13-14)
>
> "කැඳවනු ලැබුවෝ බොහෝය. තෝරාගනු ලැබුවෝ ස්වල්පය" (මතෙව් 22:14)

සැබෑවූ එකම දෙවියන්වහන්සේ සහ ක්‍රිස්තුස්වහන්සේ හැඳිනගැනීම මත දරා සිටින (යොහන් 17:3) අපගේ ගැලවීම වැදගත් යැයි සලකන්නේ නම්, දෙවියන්වහන්සේගේ වචනය අධ්‍යයනයට සහ සත්‍යය තේරුම් ගැනීමට අප උන්නඳු විය යුතුයි.

බෙරියාවේ ජනතාවගේ විශ්මය ජනක උදාහරණය බලන්න :

"............මේ කාරණා මෙසේදැයි දැනගන්නා පිණිස දවස්පතා ලියවිලි සොයමින්, සිතේ මුළු කැමැත්තෙන් වචනය පිළිගත්තෝය." (ක්‍රියා 17:11)

අපට කලින් කියා දෙන ලද කාරනා සමඟ ගැටුම් ඇති බයිබලයේ ඇති දේ ඉවත නොදමින්, ඒවා පිළිගනිමින් අපගේ කලින් තිබූ අදහස් ඉවත දමමින් දෙවියන්වහන්සේගේ වචනයට විවෘතව් එය ඥාණාන්විතව සහ තර්කාණුකූලව කියවන්නේ නම්, එවිට පමණක් දෙවියන්වහන්සේ අපට පවසන්නේ කුමක්දැයි ඇත්තටම ඉගෙනගන්නට හැකි වනු ඇත. සත්‍යය "සඟවා තිබූ වස්තුවකට" සමානය. (මතවේ 13:44). අප එය කැපවීමෙන් සහ නිශ්චිතව සෙවිය යුතුය. අවසානයේදී, ඥානවන්ත සොලමන් රජුගේ වචනය සලකා බලන්න :

"ප්‍රඥාවට ඇහුම්කන්දී , ඥානයට නුඹේ සිත යොමුකරන්නෙහි නම්, එසේය. නුඹ නුවණට හඬගසා , ඥානයට නුඹේ ශබ්දය නගන්නෙහි නම්, නුඹ රිදී මෙන් ඇය සොයා, නිධාන ගැන මෙන් ඇය ගැන විභාගකරන්නෙහි නම්, නුඹ ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීම තේරුම්ගත්තෙහිය. දෙවියන්වහන්සේ හැඳිනගැනීමටද පැමිණෙන්නෙහිය. මක්නිසාද ප්‍රඥාව දෙන්නේ ස්වාමින් වහන්සේය. උන්වහන්සේගේ මුඛයෙන් දැන ගැන්මද ඥානයද පැමිණෙන්නේය." (හිතෝපදේශ 2 : 2-6)

- ජේම්ස් සහ ඩෙබ් ෆ්ලින්ට් -

ප්‍රශ්න

1. දෙවියන්වහන්සේ ගැන බයිබලය උගන්වන්නේ කුමක්ද?

2. යේසුස්වහන්සේ ගැන බයිබලය උගන්වන්නේ කුමක්ද?

3. දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමානද?

4. යේසුස්වහන්සේ තමන්ගේ උත්පත්තියට පෙර සිටියේ කොහේද?

5. දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ අතර ඇති වෙනස්කම් 5ක් ලියන්න.

6. බයිබලය ත්‍රිත්වය සඳහන් කරයිද?

7. ත්‍රිත්ව ධර්මය පැමිණියේ කොතනින්ද?

8. “මමද පියාණන්වහන්සේද එකමය” තේරුම පැහැදිලි කරන්න.

9. යොහන්ගේ “පටන්ගැන්මේදී” තේරුම කුමක්ද?

10. “ලෝගෝස්” යන්නෙහි තේරුම කුමක්ද?